# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 254 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 12/02/2024<br>පැය 0800 |

**මාධ්‍ය නිවේදනය**

**01. මාරක රිය අනතුරක් - රත්නපුර පොලිස් වසම.**

2024.02.11 වන දින සවස් කාලයේ රත්නපුර පොලිස් වසමේ රත්නපුර කොළඹ මාර්ගයේ රත්නපුර නගරයේදී කොළඹ දෙස සිට රත්නපුර දෙසට ධාවනය වූ කාර් රථයක් ඉදිරියෙන් පැමිණි යතුරු පැදි 03 ක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරුවන් තිදෙනා සහ පසු පැදිකරුවන් දෙදෙනෙකු රත්නපුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වූ නඩුකාරදෙණිය, කුරුවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. රත්නපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - ඇහැළියගොඩ පොලිස් වසම.**

2024.02.11 වන දින සවස් කාලයේ ඇහැළියගොඩ පොලිස් වසමේ ඇහැළියගොඩ කිරිඇල්ල මාර්ගයේ හඳුරංගල ප්‍රදේශයේදී ඇහැළියගොඩ දෙස සිට කිරිඇල්ල දෙසට ධාවනය වූ වෑන් රථයක් මාර්ගය හරහා ගමන්කළ පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා ඇහැළියගොඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 66 ක් වූ හඳුරංගල, කිරිඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇහැළියගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුර සම්බන්ධයෙන් වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ඇහැළියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - රංගල පොලිස් වසම.

2024.02.11 වන දිනසවස් කාලයේදී රංගල පොලිස් වසමේ නාරම්පනාව ප්‍රදේශයේ හුළු ගඟේ පිරිසක් සමඟ දිය නෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලීමෙන් පසු ප්‍රදේශවාසීන්ගේ සහය ඇතිව ගොඩට ගෙන තෙල්දෙණිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට රංගල පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ ගනේගල, හුන්නස්ගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තෙල්දෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. රංගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**